# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2205/11 – 2020 දෙසැම්බර් මස 09 වැනි බදාදා – 2020.12.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

*යොමු අංකය:* 5/3/BD/02.

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට හාලිඇල ජල සම්පාදන ක්‍රමයේ රොක්තැන්න වත්ත කාර්යාලය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 නොවැම්බර් මස 18 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

### උපලේඛනය

බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 74 ඒ, හාලිඇල ග්‍රාම නිලධාරි වසමේ රොක්තැන්න වත්ත ගමේ පිහිටි මේ සමග එවන බලයලත් මිනින්දෝරු කේ. එල්. සුදන්ත රත්නායක මහතා විසින් 2018.04.27 දිනයෙන් අඳින ලද අංක 2357 සැලැස්මේ කැබලි අංක 01 ලෙස දක්වෙන රොක්තැන්න වත්ත නමැති සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0441 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස:-

*උතුරට* : පාර
*නැගෙනහිරට* : පාර සහ මෙම ඉඩමේ ඉතිරි කොටස
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස
*බටහිරට* : අඩිපාර සහ පාර

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය:

රොක්තැන්න වත්ත,
හපුගස්තැන්න වැවිලි සමාගම,
95 A, නම්බපතන,
ඉංගිරිය.

1A - G 33320 - 31 (2020/12)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

*යොමු අංකය:* 5/3/KG/02.

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, පන්නල - මාකඳුර, කුලියාපිටිය ජල සම්පාදන ව්‍යාපෘතියේ, ඝන මීටර් 450 ජල කුළුණ සහ ඝන මීටර් 300 භූගත ජල ටැංකිය හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත් කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

2020 නොවැම්බර් මස 18 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය - බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1142, කිතලව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කිතලව ගමේ පිහිටි, කැබලි අංක 01 හා 02 වශයෙන් දැක්වෙන "නාගලන් වත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 70 ක් පමණ වන ඉඩම් කොටස්:-

කැබලි අංක : 01
ඉඩමේ නම : නාගලන් වත්ත
ප්‍රමාණය : පර්චස් 60

මායිම්:

*උතුරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය වෙතින් සුනිල් අබේවර්ධන වෙත ලබා දී ඇති ඉඩම
*නැගෙනහිරට* : ළදරු පාසල පිටිහි ඉඩම හා කිතලව - දියවල මාර්ගය
*දකුණට* : ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස
*බටහිරට* : නාගලන් වත්ත ජනතා වතු සංවර්ධන මණ්ඩලය හිමිකම් කියන ඉඩම

කැබලි අංක : 02
ඉඩමේ නම : නාගලන් වත්ත
ප්‍රමාණය : පර්චස් 10

මායිම්:

*උතුරට* : ළදරු පාසල පිහිටි ඉඩම
*නැගෙනහිරට* : කිතලව - දියවල මාර්ගය
*දකුණට* : ග්‍රාම නිලධාරි කාර්යාලය පිහිටි ඉඩම
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය:

*කැබලි අංක 01 හා 02*
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
අංක 475, කඩුවෙල පාර,
ගනේහේන,
බත්තරමුල්ල.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.